## මධ්‍යම පරිසර අධිකාරිය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පරිසර අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු අනාවරණය විය.

(අ) ඉකුත් වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදනය අඩුවෙන් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලී බඩු සවිකිරීම් වල අගය රු. 5,452,045 ක් වැඩියෙන්ද ක්ෂය, ප්‍රතිපාදනය ඒ හා සමාන ප්‍රමාණයකින් අඩුවෙන්ද ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛණ අනුව සමාලෝචිත වර්ෂයට අදාල ලී බඩු හා සවිකිරීම් මිලදී ගැනීම රු. 1,354,887 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ලී බඩු හා සවිකිරීම් මිලදී ගැනීම රු. 169,247 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) පරිසර අධිකාරිය මාලිගාවත්ත ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ගෙවා නොතිබූ අතර එම මුදල වන රු. 11,790,000 ක ප්‍රමාණය ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 1.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයට අදාළ ව ගිණුම්වල දක්වා තිබූ පාරිතෝෂික වෙන් කිරීම රු. 110,125,260 ක් වුවද ගණනය කිරීම් අනුව රු. 109,606,316 ක් විය. ඒ අනුව රු. 518,944 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මලාය ප්‍රකාශන වල දක්වා ඇති රු. 57,626,955 වූ ණයගැතියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ණය රු. 413,738 ක ශේෂයන් 03 ක් වර්ෂ 02 සිට 04 ක් දක්වා කාලයක සිට පැවතුණි.

(ආ) මූලාය ප්‍රකාශන අනුව රු. 37,108,281 ක් වූ ණයහිමියන් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. වටිනාකම රු. 312,320 ක ගෙවිය යුතු ශේෂයන් 05 ක් වර්ෂ 02 සිට 04 දක්වා කාලයක සිට පැවතුණි.

(ඇ) මාලිගාවත්ත කාර්යාල සංකීර්ණය පවත්වාගෙන ගිය කාලයේ සිට පැවති ගෙවීය යුතු ආරක්ෂක වියදම් රු. 830,610 ක් සඳහා කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේ රු.1,710,938 ක උපචිත වියදම් අධි වෙන්කිරීමක් කර තිබූ අතර එයින් 2012 වර්ෂයේදී රු.166,448 ක් වැය කර ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව ලී බඩු හා උපකරණ ලබාගෙන තිබුණි. එම ලී බඩු හා උපකරණ සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණද, ලේඛණ ගත කර නොතිබුණි. මේ අනුව උපචිත වියදම් අධි වෙන්කිරීම් සමාලොචිත වර්ෂයේ හා පසු වර්ෂවල අනුමැතියෙන් තොර වියදම් පියවීම සඳහා යොදාගෙන තිබුණි.මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් "උපචිත වියදම් නිශ්චිතව ඇස්තමේන්තු කළ නොහැක" යනුවෙන් පිළිතුරු සපයා තිබුණි.

(ඉ) උසාවි දඩ මුදල් ලෙස ලැබිය යුතු රු. 339,333 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

අවස්ථා 03 කට අයත් එකතු වටිනාකම රු. 8,585,101ක් වූ ගනුදෙනු වලට අදාලව සාක්ෂි නොතිබීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.4 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | භාණ්ඩාගාර චක්‍රලේඛ | |
| (i) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් ඇතත් එය යාවත්කාලීනව නඩත්තු කර නොතිබුණි. |
| (ii) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි/ඒ/අයි/2002/02 චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස් පරිදි පරිගණක ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | ආයතන සංග්‍රහය XV පරිච්ඡේදයේ 1.1 වගන්තිය | අධ්‍යයන හා අභ්‍යාස යන අර්ථ නිරූපනයට ඇතුලත් කටයුතු සඳහා විදේශගත වු නිලධාරීන් 19 ක් වෙනුවෙන් අනියම් දීමනාව ලෙස දිනකට ඇ:එ:ජ ඩොලර් 50 බැගින් ගෙවා තිබුණි. ඒ අනුව රු. 251,247 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) | 2010 ඔක්තෝබර් 11 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2010/01 | දෙවන ගණයේ නිලධාරීන්ට ගෙවිය යුතු සංයුක්ත දීමනා රේට් ප්‍රමාණය වෙනුවට ගණය නොසලකා එක් නිලධාරිනියකට රු.72,107 ක් සංයුක්ත දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි. එය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි. |
| (ඈ) | 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/97 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදය | වැඩ බැලීමේ තනතුරු සඳහා මාස 03 ක උපරිම කාල සීමාවකට පත් කළ හැකි වුවත් අධිකාරියේ නිලධාරීන් 08 දෙනෙකු මෙම කාලසීමාව ඉක්මවා මාස 03ත් අවුරුදු 03ත් අතර කාල පරාසයක් තුල වැඩ බැලීමේ තනතුරු වල කටයුතු කර තිබුණි. |

(ඊ) මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මු:රෙ: 371(2)(ඇ) | වර්ෂ 16 කට වඩා පැරණි රු.189,450 ක අත්තිකාරම් ශේෂයක් වූ අතර අධිකාරිය විසින් පවරන ලද නඩු අංක 25161 දරණ නඩුවට අනුව ඇස්කිසි ක්‍රියාත්මක කර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම විත්තිකරු දැන් මියගොස් ඇති බව සාමාන්‍යාධිකාරවරයා දැනුම් දී ඇත. |
| (ii) | මු:රෙ:757 | අධිකාරියේ ප්‍රාදේශිය කාර්යාල 06 වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |

1.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ ගමන් වෙනුවෙන් පිළිසරු ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයාට ඉකුත් වර්ෂයේදී ගෙවා තිබූ රු. 47,541 ක මුදල 2012 ජුලි 31 දින දක්වා ව්‍යාපෘතියෙන් ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ගෙවීය යුතු මුද්දර ගාස්තු ලෙස ගිණුමේ රු. 1,709,312 ක් විය. 2012 ජනවාර් මස රු. 801,425 ක් පමණක් ගෙවා තිබුණි. ඉතිරිය රු. 907,887 ක් රඳවා ගෙන තිබුණි. එලෙස රඳවා ගැනීමට හේතුව විගණනයට පැහැදිලි නොකෙරුණි.

2. මූල්‍ය සමාලෝචනය

----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු. 6,305,261 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,871,112 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී අතිරික්තය රු. 2,565,851 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙහෙයම් වියදම රු. 51,496,538 කින් වැඩිවීම් මෙයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ වැදගත් දත්තයන් ඉකුත් වර්ෂයට අදාල අනුරූප අගයන් සමඟ පහත දැක්වේ.

| | 2011<br>රු(,000) | 2010<br>රු(,000) |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 275,997 | 260,000 |
| වෙනත් ප්‍රදාන | 53,596 | 57,804 |
| වෙනත් ආදායම් | 142,354 | 111,087 |
| මුළු මෙහෙයුම් වියදම් | 507,594 | 456,097 |
| අතිරික්තය | 6,305 | 8,871 |

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| ද්‍රවශීලතා අනුපාත | සම්මත අනුපාතය | වර්ෂය 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2:1 | 1.7:1 | 1.56:1 | 1.54:1 |
| ක්ෂණික වත්කම් අනුපතය | 1:1 | 1.6:1 | 1.48:1 | 1.44:1 |

ඉකුත් වර්ෂය හා සැසදීමේදී කාරක ප්‍රාග්ධන අනුපාත යහපත් තත්ත්වයක පවති.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පරිසර කළමනාකරණ ඇගයීම් අංශය ,පරිසර දූෂණ පාලන අංශය හා පරිසර අධ්‍යාපන මෙහෙයුම් අංශය යන අංශ 03ක මූල්‍ය කාර්යය සාධනය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතිය සඳහා වෙන්කල රු. 100,000,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට දරන ලද වියදම රු. 44,700,000 කි. එයින් 22 % ක් වැටුප් හා වේතන සඳහා වැයකර තිබුණි. ප්‍රතිපාදනයෙන් ඌන උපයෝජිත මුදල රු. 55,300,000 ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 55 % කි.

(ඇ) පසු භාවිත ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ ජාතික ව්‍යාපෘතියේ වාර්ෂික ක්‍රියාකාර සැලැස්මෙහි ඇතුලත් වර්ෂය තුල ඉටු කළ යුතු වූ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කිරීමේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

(i) ක්‍රියාකාර සැලැස්මෙහි අන්තර් ගත නොවු C.1.12 Waste Management activities in Public and private instructions නැමැති ක්‍රියාකාරකම සඳහා කාර්ය සාධන වාර්තාවන්ට අනුව රු.3,155,000ක මුදලක් වියදම් කර තිබුණි.

(ii) ක්‍රියාත්මක නොකල ක්‍රියාකාරකම් 20 හි වෙන්කළ ප්‍රතිපාදන රු. 8,920,000 හෙවත් 100% ක්ම ඉතිරි වී තිබුණි.

(iii) ප්‍රතිශතය 99% ත් 50% ත් අතර ප්‍රතිපාදන ඉතිරි වූ ක්‍රියාකාරකම් ගණන 14 ක් වූ අතර ඉතිරිය රු. 35,919,000 කි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

අධිකාරයේ ප්‍රාදේශිය කාර්යාලවලට සහ පැමිණිලි ඒකකයට පරිගණක මෘදුකාංග පද්ධතියක් ස්ථාපන කිරමට සඳහා 2009 වර්ෂයේදී රු. 600,000 ක පිරිවැයකට එකඟ වී රු. 300,000 ක අත්තිකාරමේ ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයේදී එම පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි.

3.3 වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ අධිකාරිය සතුව වාහන 50 ක ඇණියක් පවතින අතර එයින් වෙන් කළ වාහන 21 ක්ද සංචිත වාහන 13 ක්ද ප්‍රාදේශීය කාර්යාල සඳහා අනුයුක්ත කළ වාහන 13 ක්ද පැවතුණි. වාහන 50 ක ඇණියක් තිබිය දී කුලී වාහන සඳහා රු. 6,462,813 ක වියදමක් දරා තිබුණි.

3.4 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට අධිකාරිය අනුමත කාර්ය මණ්ඩල 802 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 683 ක් විය. ඒ අනුව පුරප්පාඩු 119 ක් පැවතුණි.

(ආ) නිලධාරීන් 08 දෙනෙකු වැඩ බැලීමේ මාස 03 ක කාල සීමාව ඉක්මවා සිටි කාලය සඳහා 2011 දෙසැම්බර් 31 දින දකවා වැඩ බැලීමේ දීමනාව ලෙස රු. 439,121 ක් හා ඉන්ධන දීමනාව ලෙස රු. 216,000 ක් ගෙවා තිබුණි.

(ඇ) 2008 නොවැම්බර් 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 52 අනුව වයස අවුරුදු 60 සම්පූර්ණ වු නිලධාරියකු නැවත සේවයේ යෙදවීම නොහැකි වුවද අධ්‍යක්ෂ ජනරාල්වරිය 2011 මාර්තු 05 දින වයස අවුරුදු 60 සම්පූර්ණවීම හේතුවෙන් විශ්‍රාම යවා තිබූ අතර අනුමැතියකින් තොරව තවදුරටත් එම ධුරයේ රාජකාරි කටයුතු සිදු කරමින් පැවතුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව සකස් කර ඇති ප්‍රගති සමාලෝචන වාර්තාවේ ඉලක්ක ලඟා කර ගැනීම ගණනය කොට නොතිබුණි. තවද 2003 ජුනි 02 දිනැති පීඊඞී 12 චක්‍රලේඛයේ 5 වන පරිච්ඡේදයේ 5.1.2 වගන්තිය අනුව ක්‍රියාකාරී සැලැස්මේ අරමුණු හා ඉලක්ක (goals and targets ) ලඟා කර ගතයුතු, වගකිව යුතු නිලධාරීන් නම් කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණක සහකාර පුරප්පාඩුව සමාලෝචිත වර්ෂයේදීද පැවතුණි.

(ආ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඕ) වගන්තිය පරිදි අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයට සාරාංශ ගත ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද එම සැලැස්මේ විස්තරාත්මක තොරතුරු ඇතුලත් ලිපි ගොනුව විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම තාත්වික ද, එය සමාලෝචනය කර තිබේද, පාලන කාරකයක් ලෙස යොදා ගෙන තිබේ ද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය.

4.4 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය ආරම්භයෙදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අයවැය ලේඛණය අනුමත කර තිබූ අතර සමාලොචිත වර්ෂය අවසානයේදි සංශෝධිත අයවැය ලේඛණය සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගෙන තිබුණි. අයවැය ගත වියදම ශිර්ෂ 07 කට අදාලව සත්‍ය වියදම් 95% සිට 957% ක පරාසයක විචලනයන් සිදු වී ඇති හෙයින් අයවැය ලේඛණය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

4.5 වාර්ෂික වාර්තා සභාගත කිරිම

අධිකාරියේ 2007 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2009 ජුනි 12 දින සභාගත කර තිබුණි. 2008 සහ 2009 වර්ෂික වාර්තා සමාලෝචිත වර්ෂය ආරම්භය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

4.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරිම.

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) විසිරි පින්තාරු බලපත්‍ර ලබාදීම.

(i) විසිරි පින්තාරු කටයුතු සිදු කිරිමේදි වායු ගෝලයට මෝචනයන් සිදුවන අතර අධිකාර්ය ඒ පිළබඳ කටයුතු කර නොතිබුණි.

(ii) ඉල්ලුම්පත සම්පුර්ණ කර නොතිබියදි ආරක්ෂණ බලපත්‍රය ලබාදි තිබුණි.

(iii) ටින්කරින් වැඩ සිදු කිරිමේදි 1996 මැයි 21 දිනැති 924/12 උපලේඛණ 01 රෙගුලාසි 02 අනුව ඩෙසිබල් 63 ට වඩා අඩු ශබ්දයක් පවත්වාගෙන යනු ලබන්නේද යන්න පරිසර අධිකාර්ය විසින් සනාථ කරගෙන නොතිබුණි.

(iv) විසිරි පින්තාරු කටයුතු සිදු කිරිම සඳහා බලපත්‍රය ලබාදි තිබුණද ක්ෂේත්‍ර පරික්ෂණ වාර 03 කදි වත් විසිරි පින්තාරුව, කුටිරය තුළ සිදු කරන්නේද යන්න අනාවරණය කර ගෙන නොතිබුණි.

(v) පරිසර ආරක්ෂණ බලපත්‍රයේ කොන්දේසි අංක 1:4 යටතේ ශබ්ද මිනුම් වාර්තාවක් හා 2:3 කොන්දේසි යටතේ වායු දුෂණ පාලන පද්ධතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාවන් මධ්‍යම පරිසර අධිකාර්ය පිළිගත් අනුමත ආයතනයකින් ලබා ගෙන බලපත්‍රය නිකුත් කළ දින සිට මාස 06 ක කාලයක් තුළ අධිකාර්ය වෙත කර්මාන්තකරු විසින් ඉදිරිපත් කල යුතු වුවත් එම බලපත්‍රයේ කොන්දේසි සම්පුර්ණ කර නොතිබුණි.

(vi) එක් පැමිණිල්ලක් 2007 වර්ෂයේ මාර්තු මස 12 වෙනිදා සිට 2011 ඔක්තෝබර් 11 දක්වා වර්ෂ 5 ක කාලයක් තුළ වාර කිහිපයකදම ලැබී තිබූ අතර එම පැමිණිල්ල සම්බන්ධයෙන් අධිකාරිය විසින් වර්ෂ 05 තුළදම පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාදී තිබූ කාර්යය තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම

(i) සංශෝධනය කිරීම මැයෙන් පරිසර අමැතිතුමා ඉදිරිපත් කළ 2006 ජූලි 21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 22 සහ 23 ඡේද යටතේ දක්වා ඇති අවශ්‍යතා ඇතුලත් වන පරිදි 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය හා එම කාර්යය සඳහා අවශ්‍ය සංශෝධන ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.

(ii) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සඳහා පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමට නීත කෙටුම්පතක් සම්පාදනයට අමාත්‍යමණ්ඩලය නියෝග කර තිබුණි.
ඒ අනුව වැඩි දියුණු කිරීමට අවශ්‍ය අංශ 18 ක් හඳුනාගෙන තිබුණද එම හඳුනා ගත් අංශයන් 18 ක් වෙනුවෙන් 2012 ජූලි 31 දක්වා පනතේ සංශෝධයන් සිදුකර නොතිබුණි.

(iii) 2011නොවැම්බර් 15 දින 119 වැනි පාර්ලිමේන්තු ප්‍රකාශන මාලාව මගින් මධ්‍යම පරිසර අධිකාරියේ හඳුනාගන්නා ලද ප්‍රධාන ගැටලු යටතේ 2008 - 2012 සංයුක්ත සැලැස්ම අනුව ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සිදු කළ යුතු බවට නියෝගයන් ලබාදී තිබුණි.2012 මැයි 24 දින වන විටත් එම සංශෝධනයන් සිදුකර නොතිබුණි.

(ඇ) පරිසර පැමිණිලි පරීක්ෂාව

(i) 2011 වර්ෂයට අදාළව අධිකාරිය වෙත ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 1974 ක් විය.කොළඹ දිස්ත්‍රික්කයෙන් පැමිණිලි 371 ක්ද ගම්පහ දිස්ත්‍රික්ක තුළින් පැමිණිලි 234 ක් ලැබී තිබූ අතර ඉන් කොළඹ දිස්ත්‍රික්කයෙන් ලද පැමිණිලි 02 ක්ද ගම්පහ දිස්ත්‍රික්කයෙන් ලද පැමිණිලි 15 ක් ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත වෙනුවෙන් විය.එම පැමිණිලි 17 ම ආයෝජන මණ්ඩලය වෙත යොමු කර තිබූ අතර ඒවා පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ii) ප්‍රාදේශිය කාර්යාල වලට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රධාන කාර්යාලයෙන් යොමු අංකයක් ලබා ගැනමේ ක්‍රම වේදයන් නොමැති නිසා පළාත් කාර්යාල වලට ලැබෙන සියළු පැමිණිලි හා යොමු කරන ලද පැමිණිලි විසදා තිබේ ද යන්න ප්‍රධාන කාර්යාලයට පැහැදිලිව හදුනා ගත නොහැකි විය.

(iii) 2012 මාර්තු මස 30 දින වන විට කැදවන ලද පැමිණිලි වල ප්‍රගති වාර්තා අනුව බස්නාහිර පළාත් කාර්යාලයේ නියැදි පරික්ෂාවේදී කළුතර පළාත් කාර්යාලවලට 70ක්ද ,දකුණු පළාත් කාර්යාලවලට 84 ක්ද ,උතුරු මැද පළාත් කාර්යාලවලට 79 ක්ද වශයෙන් පැමිණිලි 233 ක් ලැබී තිබුණි. ඉන් පැමිණිලි 28 ක් පළාත් කාර්යාල වලට යොමු කර තිබු අතර ඉතිරි පැමිණිලි වලින් 22 ක් පසුවිපරම් කර නොතිබු අතර 31ක් විසදා නොතිබුණි. පැමිණිලි 10 ක් පරික්ෂා කර හෝ නොතිබුණි.

(iv) බස්නාහිර පළාත් කාර්යාලයට ලද පැමිණිලි පරික්ෂාවේදි පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත් කර්මාන්ත වලින් ලද පැමිණිලි 371 කින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාදි ඇති කර්මාන්ත වලට විරුද්ධව පැමිණිලි 18 ක් ලැබී තිබුණි.එම කර්මාන්ත වලට බලපත්‍ර ලබා දි තිබිය දීම, පරිසර පිඩාවන් ඇති වන අයුරින් එම කර්මාන්ත ක්‍රියා කර ඇති බව පැමිණිලි වල සදහන් වී ඇත.ඒ අනුව බලපත්‍ර ලබා දීමේදි අධිකාරිය හා පළාත් පාලන ආයතන පරිසර පිඩාවන් හා බලපත්‍රයට අනුකුලවම කර්මාන්තය පවත්වාගෙන යාම පිළිබඳ අවධානයක් යොමු කර නොතිබුණි.

(v) 2011 වර්ෂයේ ජුලි මස වන විට අධිකාරිය වෙත ලද පැමිණිලි වලින් පරිසර දුෂණ පාලන අංශය වෙත පැමිණිලි 31 ක් විසදීම සදහා යොමු කර තිබුණි.එම යොමු කරන ලද පැමිණිලි වලින් පැමිණිලි 12 ක් විදුලි සංදේශන කුළුණු සවිකිරීම් සම්බන්ධයෙන් ලද පැමිණිලි විය.එම පැමිණිලි සියල්ලම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත යොමු කර තිබුණද එම පැමිණිලි විසදී නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණ වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(1) අයවැය

(2) ස්ථාවර වත්කම්

(3) ලේඛන පැවැත්වීම

(4) විදේශ ගමන්

(5) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(6) පුනරාවර්තන ආධාර

(7) පාරිතෝෂික වෙන් කිරීම්